**ශීර්ෂය - 277 මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**---------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

----------------------------

මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මොනරාගල දිස්ත්‍රික් ලේකම් කර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජුනි 23 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 මැයි 07 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, එම මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

----------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන අයුරින් සකස් කර තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

#### 1.6.1.1 ආදායම් නොවන ලැබීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් ලෙස දක්වා තිබුණු රු. 2,708,423,261 ට, වර්ෂය තුළ ආපසු භාණ්ඩාගාරයට ප්‍රේෂණය කරන ලද රු.81,000,000 ක් ගැලපීම් කර නොතිබීමෙන් වර්ෂය අවසානයේ අග්‍රිම ගිණුමේ ශේෂය රු.81,000,000 කින් වැඩියෙන් දැක්වුණි. | ACA 3 ආකෘතිය අනුව අග්‍රිම ලැබීම රු.2,708,423,261 කි. ඒ අනුව මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය සඳහා අග්‍රිම ලැබීම ලෙස එම අග්‍රිම ලැබීම ඇතුළත් කර ඇත. තවද මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා ලබාදී ඇති උපදෙස් අනුවද ශුද්ධ මුදල් ප්‍රවාහය ඇතුළත් කළයුතු බව උපදෙස් ලබාදී නොමැති බව දන්වමි. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට අදාළ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ අංක 06 අනුව අග්‍රිම ගැලපුම් ගිණුමට සටහන් ඇතුළත් කළ යුතුවේ. |

#### 1.6.1.2 තැන්පතු ලැබීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව තැන්පතු ලැබීම් රු. 379,873,089 ක් වුවද, එය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ රු. 379,912,654 ක් ලෙස රු. 39,565 ක් වැඩියෙන් දක්වා තිබුණි. | පිළිගනිමි. දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර ඇත. | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ උපදෙස් අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතුය. |

#### 1.6.1.3 පුනරාවර්තන වියදම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සෙවනගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 277–01–02–0–1301 වාහන නඩත්තු වැය විෂයය යටතේ ගිණුම්ගත කළයුතු රු. 20,515 ක කැබ් රථයක වාර සේවා වියදමක් 277–01–01–0–2003 මූලධන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම (වාහන) වැය විෂයය යටතේ ගිණුම්ගත කර තිබුණි. | පිළිගනිමි. මෙවැනි අතපසු වීම් සිදු නොවන ලෙස කටයුතු කිරීමට උපදෙස් ලබා දෙන ලදි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වැය විෂයයන් කාණ්ඩගත කර ප්‍රමිතකරණය කරනු ලැබ ඇති ආකාරයට ගිණුම්ගත කළ යුතුය. |

## 1.6.1.4 මූලධන වියදම්

----------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------ | ----------------------------------- | ----------- |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ වැල්ලවාය හා බිබිල ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් 277-1-1-0-2104 ගොඩනැගිලි සහ ඉදිකිරීම් වැය විෂයය යටතේ ගිණුම්ගත කළයුතු එකතුව රු.1,827,711 ක මූලධන වත්කම් අත්පත් කරගැනීමේ වියදම්, මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් වැය විෂයය අංක 277–1–1–0–2001 යටතේ ගිණුම්ගත කර තිබුණි. මේ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දේපල, පිරියත හා උපකරණ වටිනාකම සහ දේපල, පිරියත හා උපකරණ සංචිත වටිනාකම රු.1,827,711 ක් අඩුවෙන් හා මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීමේ වියදම රු. 1,827,711 ක් වැඩියෙන් දැක්වුණි. | 2020 වර්ෂයේ අයවැය මගින් මූලධන වත්කම් අත්පත්කර ගැනීම සඳහා ප්‍රතිපාදන වෙන් වී තිබුනේ ඉතා සීමිත ප්‍රමාණයක්ය. නමුත් වර්ෂය තුළ මෙම ඉදිකිරීම් සඳහා ඇස්තමේන්තු කර තිබූ බැවින් හා අත්‍යාවශ්‍ය කටයුත්තක් බැවින් මූලධන වත්කම් වැඩි දියුණු කිරීම් වැය විෂයය යටතේ ගිණුම්ගත කර ඇත. මෙම ඉදිකිරීම් වල වටිනාකම දේපල පිරියත හා උපකරණ වටිනාකමට ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වැය විෂයයන් කාණ්ඩගත කර ප්‍රමිතකරණය කරනු ලැබ ඇති ආකාරයට ගිණුම්ගත කළ යුතුය. |

## 1.6.1.5 තැන්පතු ගෙවීම්

-----------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ----------------------- | --------------------------------- | ------------ |
| භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව තැන්පතු වලින් ගෙවීම් රු. 424,206,191 ක් වුවද, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එය රු. 424,242,767 ක් ලෙස රු. 36,576 ක් වැඩියෙන් දක්වා තිබුණි. | පිළිගනිමි. දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර ඇත. | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ උපදෙස් අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතුය. |

## 1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

### 1.6.2.1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ නිවාස නොවන ගොඩනැගිලි, යන්ත්‍ර හා උපකරණ සහ කාර්යාලී ගොඩනැගිලි (නොනිමි වැඩ) විෂයයන්හි, ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂයන් සහ සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයන් අතර රු. 4,000,000 ක වෙනසක් නිරීක්ෂණය විය. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල දෙකක් විසින් සිදු කළ ගැලපීම් වෙනසට හේතු වී ඇත. | ආරම්භක ශේෂ තහවුරු කරගැනීම සඳහා විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ වෙනත් මූල්‍ය නොවන වත්කම් යටතේ 2020 ජනවාරි 01 දිනට හා දෙසැම්බර් 31 දිනට නොනිමි වැඩ ලෙස රු. 952,988 ක් දක්වා තිබුණද, එවැනි කෙරීගෙන යන වැඩ විෂයයක් නොපැවතුණි. | මෙම වටිනාකම 2021 මාර්තු මාසයේදී නිවාස නොවන ගොඩනගිලි වටිනාකමට එකතු කර ඇත. | වත්කම්වල නිවැරදි වටිනාකම් ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2.2 අත්තිකාරම් ගිණුම් ශේෂ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තු පොත් සමඟ භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සැසඳීමේදී භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ වර්ෂය ආරම්භයට ශේෂය රු.100,222,914 ක් වුවද, දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය රු.99,938,116 ක් වූයෙන් එම ශේෂ අතර රු.284,798 ක වෙනසක් නිරීක්ෂණය විය. | පසුගිය වර්ෂයේ බුත්තල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් කරන ලද සාවද්‍ය හර ශේෂය රු. 2,700 ක් හා වැල්ලවාය කලාප අධ්‍යාපන කාර්යාලයෙන් කරන ලද සාවද්‍ය බැර ශේෂය වන රු.287,497 ක් පැවතීම අනුව ආරම්භක ශේෂය වෙනස් වීමට හේතුවී ඇත. ඉදිරියට එම වෙනස බල නොපානු ඇත. | දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත්වල ආරම්භක ශේෂ සමාන විය යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) මිය ගිය, වැඩ තහනම් කළ හා සේවය අතහැර ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු මුළු ණය ශේෂය රු. 2,688,119 ක් වූ අතර ඉන් රු. 1,957,679 ක් වසර පහකට වඩා වැඩි කාලයක් අය නොවී පවතින ණය ශේෂ විය. | පිළිගනිමි. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

----------------------

**2.1 වියදම් කළමනාකරණය**

--------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 66 හා 69 අනුව ප්‍රතිපාදන මාරු කිරීමේදී සත්‍ය අවශ්‍යතාවය ගණනය කර ඒ අනුව මාරු කිරීම් සිදුකළ යුතු වුවද, එසේ කටයුතු නොකිරීම නිසා වැය විෂයන් 07 ක් සඳහා මාරු කර තිබුණු ප්‍රතිපාදනවලින්, සියයට 4.7 සිට සියයට 28.7 දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරිව තිබුණු බව නිරීක්ෂණය විය. | 277 ශීර්ෂය සඳහා අයවැය මගින් වෙන් කරන ලද සමස්ථ ප්‍රතිපාදන සලකා මු.රෙ 66 අනුව මාරු කරන ලද වැය විෂයයන් වල වර්ෂ අවසානයේදී ඉතිරියක් පෙන්වුවද ව්‍යාපෘති අංක 2 හි මෙම මාරු කරන ලද වැය විෂයයන් වල ඉතිරියක් නොපෙන්වයි. ව්‍යාපෘති අංක 2 හි එනම් ප්‍රාදේශිය ලේකම් කාර්යාල මගින් ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම භාවිතා කර ඇත. | සත්‍ය අවශ්‍යතාවය හඳුනාගෙන ඒ අනුව ප්‍රතිපාදන මාරු කළ යුතුය. |

**2.2 බැරකම් හා බැදීම්**

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 94 (1) අනුව වාර්ෂික ඇස්තමේන්තුවෙහි මුදල් ප්‍රතිපාදන සලසා තිබුණොත් මිස, කිසියම් දෙපාර්තමේන්තුවක් විසින් වැඩක් හෝ සේවයක් හෝ සැපයුමක් සඳහා කිසියම් වියදමකට හෝ බැරකමකට හෝ මුදල් ගෙවීමේ පොරොන්දුවකට නොබැදිය යුතු විය. එහෙත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වැය විෂයන් 06 කට අදාළව සමාලෝචිත වර්ෂය අවසානයට ඉතිරිව තිබුණු ප්‍රතිපාදන ඉක්මවා රු. 1,290,286 ක බැරකම් වලට බැදී තිබුණි. | මු.රෙ.94(ii) හි වාර්ෂික පුනරාවර්ථනය වන සේවාවන් හෝ සැපයුම් සඳහා පසුගිය වර්ෂ තුනෙහි ප්‍රතිපාදන කරන ලද මුදල් ප්‍රමාණයේ සාමාන්‍යයෙන් 50% දක්වා ඊළඟ මුදල් වර්ෂය තුළ බේරුම් කිරීමට සිදුවන බැරකම් සඳහා බැදීම් ඇතිකර ගත හැකිය යනුවෙන් සඳහන් කර ඇත.ඒ අනුව පසුගිය මුදල් වර්ෂ 03 තුළ ප්‍රතිපාදනයන් 50% නොඉක්මවන පරිදි ඊළඟ වර්ෂය | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට නොඑළඹිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | සඳහා බැඳීම් වලට එළඹ ඇති බව කාරුණිකව දන්වමි. | |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයේදී ගෙවිය යුතුව පැවති රු. 20,084 ක වියදම් මූල්‍ය ප්‍රකාශන සමඟ සටහන් අංක (iv) යටතේ ඉදිරිපත් කර ඇති බැරකම් පිළිබඳ ප්‍රකාශනයෙහි ඇතුළත් කර නොතිබුණි. | පිළිගනිමි. ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලයේ හා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතන වල බිල්පත් ඇතුළත් වී නොමැත. ඉදිරියේදී මෙවැනි දෝෂ ඇති නොවන ලෙස කටයුතු කිරීමට විෂය නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය. |

**2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **ජනාධිපති ලේකම් කාර්යාලය** | | |
| (i) | මොනරාගල දිස්ත්‍රික්කය තුළ 2018 හා 2019 වර්ෂවල ක්‍රියාත්මක කර තිබුණු ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 කට ලබාදී තිබුණු මුදලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.77,691,659 ක් ග්‍රාම ශක්ති සමිති නමින් පවත්වාගෙන යනු ලබන බැංකු ගිණුම් 125 ක වසරකට අධික කාලයක් නිෂ්කාර්යව රඳවා ඇති බව නිරීක්ෂණය විය. | මේ පිළිබඳ ඉදිරියේදී කටයුතු කළයුතු ආකාරය පිළිබඳව සමෘද්ධි, ගෘහ ආර්ථික, ශුද්ධ මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය 2021 පෙබරවාරි 03 දිනැති ලිපිය මගින් සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත දන්වා ඇති අතර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරන බව දන්වමි. | වෙන් කර ඇති මුදල් ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ii)** | ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරයේ පළමු අදියර යටතේ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක් විසින් 2019 වර්ෂයේදී චක්‍රීය ක්‍රමය යටතේ ලබාදී තිබුණු ණය මුදල්වලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද රු. 8,361,836 ක් අයවීම් හිඟ හිටව පැවතුණි. | අදාල සමිති නැවත ගිණුම් කටයුතු ආරම්භ කළ පසු හිඟ ණය මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. | හිඟ ණය මුදල් අප්‍රමාදව අය කර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | **රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ හා ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය**<br>--------------------------------------<br>2019 වර්ෂයේ මූල්‍ය ප්‍රතිපාදන උපයෝජනය කර ගෙවතු වගා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට මොනරාගල සහ බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2019 සැප්තැම්බර් මාසයේ දී මිලදී ගෙන තිබුණු රු.3,299,523 ක ගෙවතු වගා උපකරණ 2020 නොවැම්බර් 27 දින වන විටද ප්‍රතිලාභීන්ට බෙදාදී නොතිබුණි. | ගෙවතු වගා උපකරණ කට්ටල කොටසක් මේ වන විට බෙදා අවසන් කර ඇති අතර වර්තමානයේ පවතින කොවිඩ් - 19 රෝග තත්ත්වය පහව ගිය පසු ඉතිරි ප්‍රතිලාභීන් සඳහා බෙදා දීමට කටයුතු කරමි. | ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීමට හැකි අයුරින් ඵලදායි ලෙස භාණ්ඩ බෙදා හැරීමට කටයුතු කළ යුතුය. |

**2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

-----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය<br>--------------<br>වටිනාකම | <br><br>අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | --------------------- | ----------<br>රු. | ------------------ | ---------------- | ------------- |
| (අ) | 1964 අංක 29 දරන ජල සම්පත් මණ්ඩල පනතේ 16 (1) හා (2) වගන්ති සහ 2011 අංක 46 දරන පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 89 වගන්තිය | 2,330,000 | සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය යටතේ නල ළිඳක් ඉදිකිරීමේදී සහ මොනරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් "දුෂ්කර ගම්මාන වල යටිතල පහසුකම් සංවර්ධනය" සඳහා වූ වැඩසටහන යටතේ කෘෂි ළිං ඉදිකිරීමේ ව්‍යාපෘතිය මගින් වගා ළිං 04 ක් ඉදිකිරීමට ප්‍රථමව ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ සහ ජලසම්පත් මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | පිළිගනිමි. ඉදිරි සංවර්ධන කටයුතු වලදී නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇත. | පනතේ විධිවිධාන ප්‍රකාරව ඉදිකිරීම් වලට පෙර අදාළ අනුමැතිය ලබාගත යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික | 312,325 | සාද නිවාසවල (වමරි) ආර්ථික කුලිය එහි පදිංචි සෑම | සාද නිවාසවල ආර්ථික කුලිය | තක්සේරු වාර්තාව අනුව |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 5.2.3 වගන්තිය | | නිලධාරියෙකුගෙන්ම එක හා සමාන කොටස්වලින් අයකර ගත යුතු ලෙස දක්වා තිබුණද, මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාන්තා හා පිරිමි සාද නිවාස සඳහා, 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් දක්වා කාලයට අදාළව අයවිය යුතු නියමිත ආර්ථික කුලිය අඩුවෙන් අයකර තිබුණි. | අය කිරීමේදී ගැටළු පවතින බැවින් කාමර මට්ටමින් හෝ පදිංචි වියහැකි පුද්ගලයින් සංඛ්‍යාව අනුව නව තක්සේරුවක් කර දෙන ලෙස තක්සේරු දෙපාර්තමේන් තුවෙන් ඉල්ලීම් කර ඇත. | හිඟ කුලී මුදල් අයකළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>------------------------ | | | | |
| | (i) මුදල් රෙගුලාසි 396 | 375,470 | සෙවනගල, මඩුල්ල හා බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ මාස 06 ඉක්ම වූ චෙක්පත් 06 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි | පිළිගනිමි. මෙම චෙක්පත් සම්බන්ධව කඩිනමින් කටයුතු කරන බව දන්වා ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කල් ඉකුත් වූ චෙක්පත් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. |
| | (ii) මුදල් රෙගුලාසි 449(2)(ආ) | 1,013,882 | රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ හා ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රතිපාදන උපයෝජනය කර ගෙවතු වගා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වියදම් දැරීමට 130–0–02–07–2509 වැය විෂයය යටතේ රු.4,750,000 ක ප්‍රතිපාදන වෙන් කර දී තිබුණි. එහෙත් මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඒ සඳහා රු. 5,763,882 ක් වැයකර තිබුණු බැවින් පූර්ව අනුමැතිය නොමැතිව රු.1,013,882 ක් වැය කර ඇති බව නිරීක්ෂණය විය. | පිළිගනිමි. ප්‍රතිලාභීන්ගේ ඉල්ලීම මත උපකරණ හා රෝපණ ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා අමතරව ප්‍රතිපාදන මුදලක් අවශ්‍ය විය. එම මුදල ලබා දෙන ලෙස 2019 නොවැම්බර් 16 දිනැති ලිපියෙන් අමාත්‍යාංශය දැනුවත් කළ | පූර්ව අධිකාරි බලය ලබා ගැනීමකින් තොරව ප්‍රතිපාදන ඉක්මවා වැය කිරීම් නොකළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | අතර වැය ශීර්ෂය යටතේ ප්‍රතිපාදන ඉතිරිව පැවති බැවින් වියදම් පියවා ගැනීමට කටයුතු කරන ලදී. | |
| (iii) මුදල් රෙගුලාසි 571(3) | 9,230,126 | මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තැන්පතු ගිණුම් 06 ක වසර 2 සිට වසර 5 දක්වා කාල පරාසයක් ගත වී ඇති තෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් තාවකාලිකව රඳවාගන්නා තැන්පතු සහ කොන්ත්‍රාත් සඳහා වූ රැඳවුම් මුදල්, මුදල් රෙගුලාසි ප්‍රකාරව රාජ්‍ය ආදායමට බැර කර හෝ ආපසු ගෙවා හෝ නොතිබුණි. | පිළිගනිමි. ඒ අනුව ඉදිරියේදී කටයුතු කරමි. කොන්ත්‍රාත් රැඳවුම් ශේෂයෙන් කොටසක් නියාදනය කර ඇත. භාණ්ඩාගාර යෙන් ලැබෙන අග්‍රිම අනුව ඉතිරි ශේෂයන් නිරවුල් කිරීම සඳහා අදාළ නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1 සැලැසුම් කිරීම**

----------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------ | ------------------------------ | ------------ |
| සමාලෝචිත වර්ෂය සඳහා මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සකස් කර තිබුණු ක්‍රියාකාරි සැලැස්මෙහි, 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට අනුව ඇතුළත් කළ යුතු යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර, වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම, සැලසුම් කර ඇති ප්‍රධාන | විගණනය විසින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කර ගනිමින් ඉදිරියේදී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන බව දන්වමි. | චක්‍රලේඛ විධිවිධාන හා මගපෙන්වීම් වලට අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතුය |

සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සහ අභ්‍යන්තර විගණන සැලැස්ම ආදී තොරතුරු ඇතුළත් කර නොතිබුණි.

**3.2 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

**--------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | ----------------------------- | ----------- |
| (අ) | මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රතිපාදන උපයෝජනය කර පොතුකොළ පිටිය අමුණ ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ සූර්ය පැනල පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා රු.8,700,000 ක් සහ වගා ළිඳ, ජලපොම්පාගාරය සහ ඇළ මාර්ගය ඉදිකිරීම සඳහා රු.1,080,309 ක වටිනාකම් සහිත ගිවිසුම්වලට එළඹ සූර්ය පැනල ස්ථාපනය කිරීම වෙනුවෙන් රු. 8,700,000 ක් ගෙවා තිබුණි. ඇළ මාර්ගය ඉදිකිරීම 2019 සැප්තැම්බර් 10 දින වන විට අවසන් කළ යුතු වුවද, 2020 සැප්තැම්බර් 14 දින වනවිටද, එම ඉදිකිරීම් කටයුතු සිදුකර නොතිබීම හේතුවෙන් ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වී තිබුණි. තවද, සූර්ය පැනල පද්ධතියේ ආරක්ෂාව සඳහා ක්‍රියාමාර්ග නොයෙදීම නිසා සවි කර තිබුණු සූර්ය පැනල අනුවෙන්, දෙකක් හානියට පත්ව තිබුණි. | ව්‍යාපෘතිය සඳහා මුදල් ලැබීමේ ප්‍රමාදය සහ කොටස් මුදල් ගෙවීම සඳහා ප්‍රමාණවත් මුදල් නොලැබීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වී ඇත. | ඇස්තමේන්තුගත වැඩ කොටස් ගිවිසුම්ගත කාලය තුළදී නිමකළ යුතුය. |
| (ආ) | මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ 2019 වර්ෂයේ කුඩා වැව් අමුණු ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ සියඹලාණ්ඩුව, කරම්මඩ වැව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.4,916,581 ක වියදමක් දරා තිබුණි. ඉදිකිරීම් කටයුතු නිම වීමෙන් පසුව වැව ප්‍රයෝජනයට නොගැනීම නිසා දරන ලද වියදම නිෂ්කාර්ය වියදමක් බවට පත්ව ඇති බවත්, මෙම වැව ප්‍රතිසංස්කරණය කිරීම තුලින් අපේක්ෂිත ප්‍රතිලාභී ගොවි පවුල් 20 ක් මගින් කුඹුරු අක්කර 50 ක් පමණ වගා කිරීමේ අරමුණ ඉටු වී නොමැති බවත්, නිරීක්ෂණය විය. | එම ව්‍යාපෘති යෝජනාව ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුවේ දී සාකච්ඡා කර අරමුණු ළඟා කර ගැනීමට කටයුතු කරන ලෙස ප්‍රාදේශීය ලේකම් දැනුවත් කර ඇත. | අරමුදල් ඵලදායිව ප්‍රයෝජනයට ගත යුතු අතර, අපේක්ෂිත අරමුණ ඉටු කර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තු මූලා ප්‍රතිපාදන උපයෝජනය කර මොනරාගල දිස්ත්‍රික් ක්‍රමසම්පාදන ලේකම් කාර්යාලය මගින් 2019 වර්ෂයේදී මොනරාගල දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.2,019,484,413 ක වියදම් ඇස්තමේන්තුවක් පිළියෙල කර ඒ සඳහා 2020 ඔක්තෝබර් 14 දින වන විට රු. 13,389,919 ක වියදමක් දරා තිබුණු අතර 2019 ඔක්තෝබර් මාසයෙන් පසුව ව්‍යාපෘතියේ ඉදි කිරීම් කටයුතු අත්හැර දමා තිබුණි. | පිළිගනිමි.<br>මෙම කර්මාන්තයේ කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍යාය අරමුදල් ලබා ගැනීමට නොහැකි වීම හේතුවෙන් මේ වන විට වැඩකටයුතු නවතා ඇති අතර එම නිසා ක්‍රීඩා සංකීර්ණය පූර්ණ ලෙස භාවිතා කිරීමේ හැකියාව නොමැත. | ව්‍යාපෘතිය තුලින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වගා ළිඳක් ඉදිකිරීම සඳහා ප්‍රතිලාභියෙකුට රු.500,000 ක් ගෙවා තිබුණි. වගා ළිඳ කැණීම් කිරීමේදී ගලක් හමුවීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු අතර මග නවතා දමා තිබුණි. ඒ අනුව වගා ළිඳ ඉදිකිරීම තුලින් අපේක්ෂා කළ, වර්ෂාව නොමැති කාල වලදී වගා කටයුතු සඳහා ජලය ලබා ගැනීම යන අරමුණ ඉටු වී නොමැති බව නිරීක්ෂණය විය. | දැඩි නියං කාලය තුලදී ජලය ලබා ගැනීමට හැකිවන පරිදි ගල කඩා ඉවත් කිරීමට අදාළ ප්‍රතිලාභියා වෙත උපදෙස් ලබා දී උනන්දු කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇත. | සංවර්ධන ව්‍යාපෘති සඳහා වෙන් කරනු ලබන මුදල් ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගත යුතු වේ. |

## 3.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ඌව වෙල්ලස්ස භෞතික හා මානව සම්පත් සංවර්ධන වැඩපිළිවෙල කුඩා වැව් අමුණු ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන යටතේ යබරත්තාව වැව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.7,796,030 ක සිවිල් වැඩ වටිනාකමකට දින 60 ක් තුළ ව්‍යාපෘතිය නිම කිරීමට 2019 සැප්තැම්බර් 27 දින ගිවිසුම්ගත වී තිබුණු අතර, රු. 950,609 ක කොටස් මුදලක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. 2020 ඔක්තෝබර් 07 දින වන විටද රු.6,739,789 ක ඇස්තමේන්තුගත වැඩ ඉටු කර නොමැති බවත්, ඉදිකිරීම් කටයුතු අත්හැර දමා ඇති බවත්, වැය කළ මුදලද නිෂ්කාර්ය වියදමක් බවට පත්ව ඇති බවත්, නිරීක්ෂණය විය. තවද, 2006 රජයේ | ගම්පෙරලිය සංවර්ධන වැඩසටහන යටතේ මෙම වාරි කර්මාන්තයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ අතර ප්‍රමාණවත් තරම් මුදල් නොලැබීම හේතුවෙන් එම කටයුතු අතරමග නවතා ඇති බව දන්වමි. ව්‍යාපෘතියේ කටයුතු අරම්භ නොකළ බැවින් කායීසාධන සුරක්ෂණයේ කාලය දිර්ඝ කර නොමැත. | ඇස්තමේන්තු වැඩ කොටස් ගිවිසුම්ගත කාලය තුළ නිම කළ යුතුය. |

| | | |
|---|---|---|
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8(අ) ඡේදය අනුව කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබුණු රු.389,802 ක කාර්යසාධන සුරක්ෂණයේ කාලය 2019 දෙසැම්බර් 25 දිනෙන් කල් ඉකුත් වී තිබුණද, ව්‍යාපෘතිය නිමකර නොතිබියදී එහි කාලය දීර්ඝ කර ගෙනද නොතිබුණි. | | |
| (ආ) බුත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදන උපයෝජනය කර දුෂ්කර ගම්මානවල යටිතල පහසුකම් සංවර්ධනය යටතේ කෘෂි ළිං ඉදිකිරීමේ ව්‍යාපෘතිය අනුව 2019 වර්ෂයේදී කෘෂි ළිං 11 ක් ඉදිකිරීමට ප්‍රතිපාදන අනුමත කර තිබුණි. 2019 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රතිලාභීන් 04 දෙනෙකු පමණක් කෘෂි ළිං හාරා ළිඳ බැඳීම දක්වා ඉදිකිරීම් කටයුතු සිදුකර තිබුණු අතර එම ප්‍රතිලාභීන්ගෙන් දෙදෙනෙකුට පළමු වාරිකය පමණක්ද, ඉතිරි ප්‍රතිලාභීන් දෙදෙනා වෙත පළමු හා දෙවන වාරිකද ගෙවා තිබුණි. 2020 දෙසැම්බර් 09 දින වන විට මෙම ප්‍රතිලාභීන්ද කෘෂි ළිංවල ඉදිකිරීම් කටයුතු අවසන් නොකර අත්හැර දමා තිබුණු බව නිරීක්ෂණය විය. | රාජ්‍ය පරිපාලන ආපදා කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරන ලද මෙම ව්‍යාපෘතිය සඳහා නැවත ප්‍රතිපාදන නොලැබුණු හෙයින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව දන්වමි. | ව්‍යාපෘතිය සඳහා වෙන් කරන මුදල් ඵලදායීව ප්‍රයෝජනයට ගතයුතු අතර, ව්‍යාපෘතිය අඛණ්ඩව අධීක්ෂණය කළ යුතුය. |

**3.4 දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් විසින් ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘතිවල ඉටුකළ යුතු වැඩ කොටස් අඩුවෙන් ඉටුකර තිබීම, අදාළ නොවන මිල රේටයන් භාවිතා කර තිබීම, මාර්ග මිල ගණන් ලේඛනයේ සඳහන් උපදෙස් අනුව කටයුතු නොකිරීම, නිමකළ වැඩ ප්‍රමාණය ඉක්මවා ගෙවීම් කිරීම, රජයට වාසිදායක ලෙස ඇස්තමේන්තු සකස් නොකිරීම සහ ප්‍රමාද ගාස්තු අය නොකිරීම යනාදී කරුණුවලට අදාළව කොන්ත්‍රාත්කරුවන්ට එකතුව රු.7,472,044 ක් වැඩිපුර ගෙවා තිබුණු අතර එයින් මොනරාගල දිස්ත්‍රික් ලේකම් | මෙම ව්‍යාපෘතිවලට අදාළව අයකර ගැනීම් පිළිබඳ විස්තර හා පැහැදිලි කිරීම් සිදුකර ඇත. | ඇස්තමේන්තු සකස් කිරීම හා ගෙවීම් වාර්තා සකස් කිරීම නිවැරදිව, වගකීමෙන් යුතුව කළයුතු අතර වැඩිපුර ගෙවූ ඉතිරි මුදල් අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කාර්යාලය සහ මොනරාගල, බුත්තල සහ සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාලව රු.4,524,460 ක් තවදුරටත් අයවීමට පැවතුණි. | | |
| (ආ) | රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදන උපයෝජනය කර, කන්ද උඩරට උරුමය ආරක්ෂා කිරීම හා සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ පරෙයියන් ඇල්ල වෙත ගමන් කරන මාර්ගය සංවර්ධනය කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රු.2,434,035 ක ගෙවීම් වාර්තාවක් සකස් කර ඉන් රු.1,376,704 ක කොටස් මුදලක් ගෙවා තිබුණි. මාර්ගය දෙපස මාර්ග උරහිස් පිරවීම වෙනුවෙන් රු.79,059 ක් ඇස්තමේන්තු කර තිබුණු නමුත් එම කාර්යය ඉටු කර නොමැති බවද, මෙම කාර්යය ඉටු කළයුතු ඉතා අත්‍යවශ්‍ය කාර්යයක් බවද නිරීක්ෂණය විය. | අතරුඳවුම් මුදල් ගෙවීමට ප්‍රථම මෙම කොටස නිම කරවා ගැනීමට සැලසුම් කොට ඇති බව දන්වා ඇත. | ඇස්තමේන්තු කළ කාර්යයන් ඒ අනුව ඉටුකර ඇති බවට තහවුරු කර ගැනීමෙන් පසු ගෙවීම් කළ යුතුය. |
| (ඇ) | ගම්පෙරළිය සංවර්ධන වැඩසටහන 2018 යටතේ මීයකෙටුආර වැව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.49,310,900 ක මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස්කර තිබුණි. මෙම ඇස්තමේන්තුවෙහි කළුගල් භාවිතයෙන් වැවෙහි රළපනාව ඉදිකිරීම සඳහා රු.4,076,800 ක් ඇතුළත්ව තිබුණු අතර, ගල් මිලදී ගැනීම සඳහා පමණක් රු.4,974,900 ක් වැයකර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තු කළ පිරිවැය ඉක්මවා රු. 898,100 ක් කළුගල් මිලදී ගැනීම සඳහා පමණක් වැය කර තිබුණි. වැව් බැම්මේ අතුරා තිබුණු කළුගල් ඇස්තමේන්තුවේ සඳහන් ඝනකම සහිතව අතුරා නොතිබුණු අතර, ඉතිරි කළුගල් වැව් පරිශ්‍රයේ ගොඩ ගසා තිබුණි. | ගම්පෙරළිය සංවර්ධන වැඩසටහන යටතේ මීයකෙටුආර වැව ප්‍රතිසංස්කරණය කිරීමේදී වැව් බැම්මේ රළපනාව සඳහා කළුගල් ඇතිරීම සිදු කර ඇති අතර, එහි මූලික යෙදීම කොටසක් සිදු කර ඇත. වර්ෂාව ලැබීමට ආසන්න වී ඇති හෙයින් යන්ත්‍ර මඟින් කළුගල් ඇතිරීම කළ ද එහි වැඩ අවසන් නොකිරීම නිසා නියමිත ඝනකම හා හිඩැස් අසම්පූර්ණව පවතින බව දන්වමි. වැව් බැම්මේ රළපනාව ඉදිකිරීම් සම්පූර්ණ නොකිරීම නිසා ඉතිරි කළු ගල් වැව පරිශ්‍රයේ ගොඩ ගසා ඇති බව ද දන්වමි. | ඉදිකිරීම් කටයුතු ඇස්තමේන්තුව ප්‍රකාරව සිදුකළ යුතුය. |
| (ඈ) | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කර තිබුණු ඉදිකිරීම් ව්‍යාපෘති සහ නැවත පදිංචි කිරීමේ වැඩසටහන - 2020 යටතේ, බිබිල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් නිවස ඉදිකිරීම වෙනුවෙන් බිම් සැකසීම හා අත්තිවාරම දැමීම සඳහා ප්‍රතිලාභියෙකුට රු.200,000 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. එහෙත් 2021 අප්‍රේල් 07 දින වන විටද නිවස ඉදිකරනු ලබන ඉඩමේ කොන්ක්‍රීට් කුලුණු ඉදිකිරීම සඳහා වළවල් කැපීම | නිවස ඉදි කිරීම, බිම සැකසීම හා අත්තිවාරම් දැමීම පසුගිය මාස කිහිපයේ පැවති අධික වර්ෂාව හේතුවෙන් ඉතා දුෂ්කර වීම වැඩ ප්‍රමාද වීමට ප්‍රධාන හේතුව විය. එමෙන්ම මෙම ඉඩමෙහි ඉදිවන නිවස තට්ටු නිවසක් වන බැවින් අඩි 05 ක පමණ ගැඹුරු වළවල් සකස් කිරීමටද, ඉඩම කුඹුරු ඉඩමක් බැවින් කොන්ක්‍රීට් කණු ඉදි කිරීමට ප්‍රථමයෙන් අඩියක | ඉදිකිරීම් කටයුතු පිළිබඳ පසු විපරම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පමණක් සිදුකර තිබුණි. | පමණ කොන්ක්‍රීට් තට්ටුවක් දැමීමට සිදු වේ. ඒ අනුව මේ වන විට අඩියක පමණ කොන්ක්‍රීට් තට්ටුවක් දමා අවසන් කර ඇති අතර අඛණ්ඩව ඉදිරි වැඩ කටයුතු සිදු කරන බව බිබිල ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇත. | |
| (ඉ) | සෙවනගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගම්පෙරලිය වැඩසටහන - 2018 යටතේ වැලි ආර පන්සල අසලින් කුමාරපුරට ඇති මාර්ගය සංවර්ධනය කිරීම සඳහා 2019 වර්ෂයේදී රු. 951,505 ක් ගෙවා තිබුණි. මාර්ගයේ කොන්ක්‍රීට් කැටගල් අල්ලා ඇති කොටසේ දෙපැත්තෙහි රු. 33,357 ක් වැය කර යොදා තිබුණු කොන්ක්‍රීට් බැම් වලින් (Curb) එක් පැත්තක කොන්ක්‍රීට් බැම්මේ ස්ථාන 19 ක පිපිරීම් සිදුව කැඩී යාමට ආසන්න තත්ත්වයේ පැවතුණි. | අතරුදවුම් නිදහස් කර ඇති බැවින් කොන්ත්‍රාත්කරු ලවා නිවැරදි කිරීමේ හැකියාවක් නොමැති බවත්, නඩත්තු කටයුතු සිදු කරන ලෙස අදාළ පළාත් පාලන ආයතනය දැනුවත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | ඉදිකිරීම් කටයුතු නියමිත ප්‍රමිතියට සිදු කළයුතු අතර ඉදිකිරීම් වල අඩුපාඩු කඩිනමින් සකස් කළ යුතුය. |
| (ඊ) | කතරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සපිරි ගමක් ජනතා සහභාගිත්ව ග්‍රාමීය සංවර්ධන වැඩසටහන - 2020 යටතේ වල්ලිමාතාගම ග්‍රාම නිලධාරී වසමේ මාර්ගයක් කොන්ක්‍රීට් කිරීම සඳහා රු. 989,735 ක වියදමක් දරා මාර්ගය මීටර් 108 ක් දිගට සහ මීටර් 3.1 ක් පළලට සංවර්ධනය කර තිබුණි. එහෙත් එහි ස්ථාන 04 ක වර්ග මීටර් 16.87 ක සහ තවත් ස්ථාන දෙකක මීටර් 10.7 ක සහ මීටර් 1.9 ක ඉරිතැලීම් සිදුව තිබුණි. එමෙන්ම වැලි හා තාර මිශ්‍ර කර මාර්ගයේ ප්‍රසාරණ මූට්ටු සකස් කර ඇති බව දක්වා රු. 5,030 ක් ගෙවා තිබුණද, ප්‍රසාරණ මූට්ටු සකස් කර නොතිබුණි. | පිළිගනිමි. ඉහත මාර්ගය වැලි ගල් පැටවූ ටිපර් රථ ධාවනය සඳහා නිරන්තරයෙන් යොදා ගන්නා බැවින් ඉරි තැලීම් වලට ලක්ව ඇත. එසේ ඉරි තැලීම් වලට ලක්වී ඇති කොටස් තාර සහ චිප්ස් යොදා ගනිමින් සකස් කරන ලෙස කොන්ත්‍රාත්කරුට උපදෙස් ලබා දෙන ලදි. ඇස්තමේන්තු ප්‍රකාරව ප්‍රසාරණ මූට්ටු සකස් කරන ලෙස කොන්ත්‍රාත්කරුට දන්වා ඇත. ප්‍රගතිය ඉදිරියේදී වාර්තා කිරීමට කටයුතු කරමි. | මාර්ගය දීර්ඝ කාලයක් භාවිතයට ගත හැකි වන පරිදි නියමිත ප්‍රමිතියට ඉදිකළ යුතුය. |
| (උ) | කතරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සපිරි ගමක් ජනතා සහභාගිත්ව ග්‍රාමීය සංවර්ධන වැඩසටහන 2020 යටතේ ගාමිණීපුර ග්‍රාම නිලධාරී වසමේ මාර්ගයක කොන්ක්‍රීට් යෙදිම සඳහා රු. 968,087 ක වියදමක් දරා තිබුණි. මාර්ගයේ දෙපස උරහිස් පිරවීම සඳහා රු.13,751 ක් ඇස්තමේන්තු කර තිබුණද, එම කාර්යයන් ඉටුකර නොතිබුණි. | කොන්ත්‍රාත්කරු විසින් නියමිත ප්‍රමිතියෙන් යුත් ග්‍රැවල් පස් නොයෙදූ නිසා ගෙවීම් නොකරන ලදි. මෙම කාර්ය සම්පූර්ණ කිරීමට කොන්ත්‍රාත්කරුට දැනුම් දුන්නද එය ඉටු කිරීමට අපොහොසත් වී ඇත. | ඇස්තමේන්තුගත ආකාරයට ව්‍යාපෘතියේ කාර්යයන් ඉටුකර ඇති බව තහවුරු කර ගැනීමෙන් පසු ගෙවීම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | කතරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගම්පෙරලිය සංවර්ධන වැඩසටහන - 2019 යටතේ කඳසුරිඳුගම ග්‍රාම නිලධාරී වසමේ මාර්ගයක් මීටර් 69.95 ක් දිගට සහ මීටර් 3.7 ක් පළලට කොන්ක්‍රීට් කිරීම සඳහා රු. 774,149 ක් වැය කර තිබුණි. මෙම මාර්ගයේ ස්ථාන 04 ක වර්ග මීටර් 122 ක ප්‍රමාණයක් පලුදු වී ගල් ගැලවී යමින් පවතින බවත්, කොන්ක්‍රීට් යොදා තිබුණු මාර්ගය මැදින් මීටර් 26.7 ක දිගකින් යුත් කොටසක් ඉරිතලා ඇති බවත් නිරීක්ෂණය විය. | පිළිගනිමි. එම ස්ථාන නැවත සකස් කරන ලෙස කොන්ත්‍රාත්කරුට උපදෙස් ලබාදෙන ලදී. | මාර්ගය දීර්ඝ කාලයක් භාවිතයට ගත හැකි වන පරිදි නියමිත ප්‍රමිතියට ඉදිකළ යුතුය. |

## 3.5 වත්කම් කළමනාකරණය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ------------------------------------ | -------------- |
| (අ) | මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වාහන 14 ක් වර්ෂ 10 කට අධික කාලයක් කාර්යාල භූමියේ නිෂ්කාර්යව රඳවා තිබුණු අතර, ඒවා අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | මේ අතුරින් වාහන 09 ක් සුන්බුන් තත්ත්වයේ පවතී. එම වාහන වෙන්දේසි කිරීමට අදාළ කටයුතු සිදු කරමින් පවතී. | අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලැබී තිබුණු යතුරු පැදියක් 2014 වර්ෂයේ සිට වසර 06 කට අධික කාලයක් නිෂ්කාර්යව රඳවා තිබුණු අතර, එය අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | යතුරුපැදිය ඉදිරියේදී අපහරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වමි. | අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2018 මාර්තු 19 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2018 අනුව, 2015 ජූලි 10 දිනැති මුදල් චක්‍රලේඛ අංක 01/2015 මගින් ලබාදී ඇති උපදෙස් අනුගමනය කර ධාවනය කළ නොහැකි තත්ත්වයේ පවතින සියලුම වාහන 2018 ජුනි 30 දිනට පෙර අපහරණය කරන ලෙස සියලුම රාජ්‍ය ආයතන ප්‍රධානීන් දැනුවත් කර තිබුණද, ඊට අනුකූල | කැබ් රථය හා යතුරු පැදිය ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය මගින් මඩුල්ල කොට්ඨාශයේ පවත්වාගෙන යනු ලබන කාර්මික පුහුණු පාඨමාලාවන්හි පුහුණු කිරීම් සඳහා ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරන බැවින් අපහරණය කිරීම සිදු කර නොමැත. ට්‍රැක්ටර් රථය අපහරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වා සිටිමි. | චක්‍රලේඛ උපදෙස් අනුව අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නොවී මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ධාවනය කළ නොහැකි තත්ත්වයේ පවතින කැබ් රථයක්, ට්‍රැක්ටර් රථයක්, යතුරු පැදියක් හා නඟුලක් 2021 පෙබරවාරි 12 දින වන විටත් කාර්යාල පරිශ්‍රයේ රඳවා තිබුණි. | | |
| (ඇ) | සියඹලාණ්ඩුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය සතු විදුලි ජනක යන්ත්‍රයක්, ජීප් රථයක්, ට්‍රැක්ටර් බවුසරයක්, ලොරි බවුසර් රථයක් හා යතුරු පැදියක් දීර්ඝ කාලයක සිට භාවිතයට නොගෙන පවතින බව නිරීක්ෂණය විය. | විදුලි ජනක යන්ත්‍රය පිළිබඳව ඉදිරි භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල තීරණයක් අනුවද, ජීප් රථය ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය වෙත ලබාදීමටද, ට්‍රැක්ටර් බවුසරය සහ ලොරි බවුසර් රථය අපහරණය සඳහාද අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වමි. තවද, යතුරු පැදිය මෝටර් රථ පරීක්ෂක වරයාගේ නිර්දේශ ලබා ගැනීමෙන් පසු ඉදිරි කටයුතු සිදු කරන බව දන්වමි. | අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.6 පාඩු හා හානි

---------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | -------------------------------- | ----------- |
| (අ) | මොනරාගල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයක් 2009 මාර්තු 23 දින අනතුරකට පත්වී තිබුණු අතර, මෙම කැබ් රථය රක්ෂණය කර නොතිබීම හේතුවෙන්, අලුත්වැඩියා කිරීම සඳහා දරන ලද රු. 3,074,975 ක සම්පූර්ණ වියදම රජයේ මුදලින් දැරීමට සිදුවී තිබුණි. අලාභය සඳහා වගකිව යුතු නිලධාරියකු නොමැති බව දක්වමින් අලාභය පොතෙන් කපා හැරීම සඳහා වන මුදල් රෙගුලාසි 109 වාර්තාව 2015 ජූලි 16 දින ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත යවා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටද ඒ සඳහා අනුමැතිය ලැබී නොතිබුණි. | මෙම අනතුරට අදාළ අලාභ පොතෙන් කපා හැරීම සඳහා මු.රෙ. 104 (4) අවසන් පරීක්ෂණ වාර්තාවේ ඇති දෝෂයන් නිවැරැදි කර අදාල අලාභය පොතෙන් කපා හැරීම සඳහා මු.රෙ. 109 වාර්තාව අමාත්‍යාංශ අනුමැතියට යවා ඇත. | අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | බුත්තල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් | මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව | මුදල් රෙගුලාසි |

| | | | |
|---|---|---|---|
| | කැබ් රථයක් 2020 අගෝස්තු 05 දින අනතුරකට පත්වී රු. 141,700 ක අලාභයක් සිදුවී තිබුණි. 2021 මාර්තු 22 වන විට අනතුර සිදුවී මාස 07 ක් ගත වී තිබුණද, මුදල් රෙගුලාසි 104 (4) අනුව අවසාන වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | අවසන් පරීක්ෂණයට අදාළ කටයුතු සිදු කරමින් පවතී. | 104 (4) ප්‍රකාරව පරීක්ෂණ කටයුතු අප්‍රමාදව සිදුකළ යුතුය. |
| (ඇ) | වැල්ලවාය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයක් 2002 සැප්තැම්බර් 19 දින අනතුරකට පත්වී තිබුණු අතර, මුදල් රෙගුලාසි 104 (4) වාර්තාව අනුව රු. 375,000 ක අලාභය රියදුරුගෙන් අයකර ගැනීමට තීරණය කර තිබුණි. මෙම අලාභය රියදුරුගෙන් අයකර ගන්නා ලෙස 2013 අප්‍රේල් 23 දින පැවති රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේදී නියෝග කර තිබුණි. එම නියෝගය ලබා දී වසර 08 කට ආසන්න කාලයක් ගතවී තිබුණද, එම අලාභයෙන් රු. 92,500 ක් පමණක් අයකර ගෙන තිබුණි. | මෙම අනතුර සම්බන්ධයෙන් වගකිවයුතු රියදුරුගෙන් අනතුරට අදාළ අලාභය වන රු.375,000 ක මුදලින් රු. 92,500 ක් මේ වන විට අයකර ගෙන ඇති අතර මසකට රු. 2,500 බැගින් අඛණ්ඩව අයකිරීම් සිදු වන බව දන්වා සිටිමි. | අලාභය අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | වැල්ලවාය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයක් 2020 නොවැම්බර් 11 වන දින අනතුරකට පත්වී රු. 664,400 ක අලාභයක් සිදුවී තිබුණු අතර, ඉන් රු. 609,250 ක් පමණක් ජාතික රක්ෂණභාර අරමුදලෙන් ප්‍රතිපූර්ණය කර තිබුණි. 2021 මාර්තු 22 දින වන විට අනතුර සිදු වී මාස 04 ක් ගත වී තිබුණද, මුදල් රෙගුලාසි 104(4) අනුව අවසාන වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | අවසන් පරීක්ෂණ මණ්ඩලය පත්කිරීම සඳහා 2021 මාර්තු 05 දිනැති ලිපියෙන් අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලැබී ඇත. ඒ අනුව අවසන් පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතී. | මුදල් රෙගුලාසි විධිවිධාන අනුව පරීක්ෂණ කටයුතු අප්‍රමාදව සිදු කළ යුතුය. |
| (ඉ) | වැල්ලවාය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයක් 2016 දෙසැම්බර් 17 දින අනතුරකට ලක් වීමෙන් රු. 2,630,726 ක අලාභයක් සිදුවී තිබුණු අතර, එම අනතුරෙන් පසු සිදුකළ අලුත්වැඩියාවන් සඳහා රක්ෂණයෙන් ආවරණය නොවූ රු.188,524 ක් මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් දරා තිබුණි. අනතුර සිදුවී වසර 04 කට අධික කාලයක් ගතවී තිබුණද, 2021 මාර්තු 23 වන දින විටද අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 (4) පරිදි පරීක්ෂණ පවත්වා අවසාන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. එමෙන්ම රජයේ වියදමෙන් දරන ලද රු. 188,524 ක අලුත්වැඩියා වියදම පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනයේ තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු යටතේ දක්වා නොතිබුණි. | අවසන් පරීක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා පරීක්ෂණ මණ්ඩලයක් පත්කර ඇති අතර, එම කමිටු නිලධාරීන්ට සිහි කැඳවීම් ලිපි මගින් දැනුවත් කළද, මේවන තෙක් අදාළ වාර්තා ලබාදී නොමැත. | මුදල් රෙගුලාසි විධිවිධාන අනුව පරීක්ෂණ කටයුතු අප්‍රමාදව සිදුකළ යුතුය. |

## 3.7 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මොනරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සපිරිගමක් වැඩසටහන 2020 යටතේ හුලංදාව දකුණ පළමු පියවර 12 කඩය අසලින් ඇති මාර්ගයේ බෝක්කුව අලුත්වැඩියා කිරීම සඳහා රු.495,000 ක වියදමක් දරා තිබුණද, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ ස්ථානයේ නව පාලමක් ඉදිකරමින් පවතින බැවින් එය ඉදිකිරීම සඳහා, ඉදිකර තිබුණු බෝක්කුව කඩා ඉවත්කර තිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා දරන ලද වියදම නිෂ්කාර්ය වියදමක් බව නිරීක්ෂණය විය. | කර්මාන්තයේ කාර්යයන් 2020 නොවැම්බර් 12 වන දින නිමවා තිබුණි. නමුත් 2020 දෙසැම්බර් 28 දින ග්‍රාමීය පාලම් ව්‍යාපාතිය මඟින් එම ස්ථානය සඳහා පාලමක් යෙදීම සිදු කරන බවට දැනුම් දීමක් කර ඇති අතර අදාල බෝක්කුව ඉදිකිරීම් කාලයේ දී දැනුම්දීමක් සිදු කර නොමැති බව දන්වමි. | අරමුදල් ඵලදායීව උපයෝජනය කිරීම සඳහා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පෙර ඒවායේ අවශ්‍යතාවය පිළිබඳ නිවැරදි ඇගයීමක් සිදුකළ යුතුය. |

## 3.8 කළමනාකරණ දූර්වලතා

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2015 දෙසැම්බර් 11 දිනැති අංක MO/RG/301 දරන තක්සේරු වාර්තාව අනුව 2016, 2017 සහ 2018 වර්ෂවලදී මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් රජයේ නිවාස සඳහා කුලී අය නොකිරීම හේතුවෙන් එම වර්ෂවලට අදාළ හිඟ නිවාස කුලිය රු. 1,506,250 ක් විය. ඉන් 2021 මාර්තු 30 දිනට රු. 17,400 ක් පමණක් අය වී තිබුණද, රු. 1,488,850 ක් තවදුරටත් හිඟව පැවතුණි. රජයේ නිවාස සඳහා අවසන් වරට තක්සේරුව සිදුකර වසර 05 ක් ඉකුත්ව තිබුණද, තක්සේරු කුලිය සංශෝධනය කර නොතිබුණි. | 2016 ජනවාරි මස සිට 2018 අගෝස්තු මාසය දක්වා හිඟ නිවාස කුලී අය කිරීම සඳහා අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත. එහි දී නිලධාරීන් කිහිපදෙනෙක් විසින් එකවර ගෙවීම් කිරීමට නොහැකි බැවින් වාරික ලෙස ගෙවීම් කිරීමට ඉල්ලා තිබූ අතර එම ඉල්ලීම් රේඛීය අමාත්‍යාංශ වෙත අනුමැතියට යවා ඇත. අනුමැතිය ලද නිලධාරීන්ගෙන් මේ වන විට වාරික ලෙස අය වන අතර අනෙකුත් නිලධාරීන් හට නැවත සිහිකැඳවීම් ලිපි යොමු කර ඇත. | තක්සේරු වාර්තා අනුව හිඟ නිවාස කුලී අයකරගත යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කළ යුතු වුවද, මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එම චක්‍රලේඛ උපදෙස් අනුව සමාලෝචිත වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබුණු අතර, සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම 2020 හා 2021 වර්ෂයන්ට අදාලව ඉලක්ක ගත අරමුණු ලබාදී සෑම නිලධාරියෙකු විසින්ම වර්ෂයේ ආරම්භයේදී කාර්යසාධන ගිවිසුමක් අත්සන් කරනු ලබයි. ඒ අනුව මාසිකව එක් එක් නිලධාරියා විසින් තම ඉලක්ක සම්බන්ධ ප්‍රගතිය මා වෙත වාර්තා කරනු ලබයි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක සේවක සංඛ්‍යා විස්තරය අනුව මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරු 14ක්ද, තෘතීයික ශ්‍රේණියේ තනතුරු 17ක්ද, ද්විතීක ශ්‍රේණියේ තනතුරු 194 ක් සහ ප්‍රාථමික සේවයේ තනතුරු 08 ක්ද පුරප්පාඩුව පැවතුණි. | අනුමත කාර්ය මණ්ඩල තොරතුරු සම්බන්ධව දැනට සිටින සේවක සංඛ්‍යාව සහ පුරප්පාඩු වී ඇති තනතුරු සම්බන්ධයෙන් සාරාංශ ගත වාර්තාවක් මා විසින් රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන වෙබ් අඩවිය තුළ මාසිකව යාවත්කාලීන කරනු ලබයි. තවද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවටද මේ සම්බන්ධව ත්‍රෛවාර්ෂිකව තොරතුරු වාර්තා කිරීමක් සිදුවේ. | අත්‍යවශ්‍ය තනතුරු සඳහා වන පුරප්පාඩු පිරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | 2020 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07ක තනතුරු 22ක් අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා අතිරික්තව පැවතුණු බව නිරීක්ෂණය විය. | මාගේ ඉල්ලීමකින් තොරව අමාත්‍යාංශය විසින් අනුමත තනතුරු සඳහා සේවකයින් අනුයුක්ත කරන බැවින් ඇතැම් තනතුරු සඳහා සුළු අතිරික්ත සේවක සංඛ්‍යාවක් පවතින බව දන්වමි. | අතිරික්ත සම්බන්ධයෙන් අදාළ කටයුතු කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2001 අගෝස්තු 21 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව උපරිම කාල සීමාව වසර 05ක් එකම තනතුරේ /සේවා ස්ථානයේ සේවය කර ඇති සෑම නිලධාරියෙකුටම වෙනත් සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩදීම සඳහා ස්ථාන මාරුවීම් ලබාදිය යුතු වුවද, මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක සේවයේ නියුතු නිලධාරීන් 584 දෙනෙකු වසර 06 සිට වසර 29 ක් දක්වා කාලයක් එකම සේවා ස්ථානයේ සේවයේ යොදවා තිබුණි. | වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම් කලද බොහෝ නිලධාරීන් හට වාර්ෂික ස්ථාන මාරු ලැබී නැති බව අනාවරණය වී ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතුය. |